**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2022.08.01**
**පළාත් ඉංජිනේරු කාර්යාංශය**

2022 වර්ෂයේ II කාර්තු වෙහි II වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2022.08.01 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත ඉදිරිපත් කරමි.

2022.08.01 වන දින පෙ.ව.9.00 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වැ.බ. ජී.ඩබ්.පී.පෙරේරා මියගේ ප්‍රධානත්වයෙන් සහ එතුමිය විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**සහභාගී වූ නිලධාරීන්**

01. ජී.ඩබ්.පී.පෙරේරා මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වැ.බ. - පළාත් ඉංජිනේරු කාර්යාංශය
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්‍ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
03. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්‍ෂ (ගිණුම් හා ගෙවීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලය
04. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාලය
05. එස්.ඒ.ඩී.පී.ප්‍රියදර්ශනී මිය - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
06. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
07. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
08. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
09. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
10. බී.ඩී.සී.එස්.බඹරගම මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
11. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
12. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය

ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්‍ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදී.

1. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මීගමුව.
2. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හොරණ.
3. එග්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු පානදුර.
4. එච්.එස්.චන්දන මයා- ප්‍රාදේශීය ඉංජිනේරු මිනුවන්ගොඩ.
5. ආර්.ඒ..විජයප්‍රිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු බියගම.
6. එස්.ඩී.සේනාරත්න මිය- ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන.
7. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ.
8. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම.
9. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම.
10. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල.
11. පී.ඩී.ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කොළඹ.
12. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල.
13. එස්.එස්.මිල්ලනියගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කළුතර.

**01. <u>පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම</u>**

| | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය/වගකීම |
|---|---|---|---|
| 1.1 | (I) පළාත් සභා නව ගොඩනැගිල්ලට ඔරලෝසු මිලදී ගැනීම | තැන්පතු මුදල නිදහස් කිරීම සඳහා අදාල ආයතනයෙන් ඉංජිනේරු කාර්යාංශයෙන් නැවත ඉල්ලුම් කර නැති අතර, තැන්පතු මුදල් නිදහස් කරනු ලබන්නේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් බවත් එම තැන්පතු නිදහස් කිරීමට බාධාවක් නොමැති බව පළාත් මාර්ග සංවර්ධන අධිකාරි වෙත දන්වා යවා ඇති බවත් මුලස්ථාන ඉංජිනේරු පවසන ලදී. | |
| 1.2 | (II) නව පළාත් සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් ගෙවීම පිළිබඳව | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තව දුරටත් ඉතිරිව ඇත්තේ රඳවුම් 5 ක රඳවුම් මුදල් බවත් ඉතිරි රඳවුම් නිරවුල් කර ඇති බවත් මුලස්ථාන ඉංජිනේරු පැහැදිලි කරන ලදී. | අවශ්‍ය වුවහොත් නැවත විමසීමක් කරන බව විගණන අධිකාරි පවසන ලදී. |
| 1.3 | කළුතර නව ආදායම් ගොඩනැගිල් තුල බැංකු අනු ශාඛාවක් ස්ථාපනය කිරීම | මුදල් අය කිරීම රු.250/- ක මුදලක් මතයට අයකරන බවත්, පසුගිය කාලයේ කාර්යාල වසා තිබූ බැවින් බැංකුවට ගෙවීම් කරන ලෙසත් දැන් නැවත ප්‍රාදේශීය කාර්යාල හරහා එම ගෙවීම සිදුවන බවත් , මුද්දර ගාස්තු නීතිඥ විසින් බැංකුගත කරන බැවින් අවශ්‍ය නොවන බවත් අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්) කළ විමසීමේදී ආදායම් කොමසාරිස්(බ.ප. ප්‍රකාශ කරන ලදී. | |
| 2.1 | "Complain Management" විගණන විමසුම අංක: WNP/CB/R/EB/2020/AQ/5 හා 2020.02.10 | මෙම මෘදුකාංගය භාවිතා කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිරිස් හා පුහුණු අංශය සමඟ අවස්ථා හතරකදීම උත්සහ කළද එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් 2022.08.24 දිනෙන් පසු ITRDA ආයතනය සමඟ සම්බන්ධ වී කාර්යාලයකින් නිලධාරින් දෙදෙනෙකු බැගින් කැඳවා පුහුණුවක් දීමට ලබා දීමට කටයුතු කරන බව මුලස්ථාන ඉංජිනේරු විසින් ගන්නා ලදී.<br>කලින් කලට මෙම මෘදුකාංගය සම්බන්ධයෙන් දැනුවත් කිරීම වැදගත් බව විගණන අධිකාරි පවසන ලදී.<br>පුහුණුව ලබා දීමෙන් පසු පුහුණු නිලධාරින්ගේ නාම ලේඛනයක් අදාල කාර්යාල දැනුවත් කිරීමට සුදුසු බව අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම් ) යෝජනා කරන ලදී. | මුලස්ථාන ඉංජිනේරු |
| 2.2 | හය මාසය ඉක්මවා නිරවුල් නොවූ චෙක්පත් | කොළඹ, බත්තරමුල්ල හා පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල 6 මාසය ඉක්මවූ චෙක්පත් ඇති බවත්, කළුතර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයෙන් 2022 මාර්තු මාසයෙන් පසු බැංකු සැසඳුම් ඉදිරිපත් කර නොමැති බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී. මෙම චෙක්පත් හැකි ඉක්මනින් නිරවුල් කරන ලෙස අදාල ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් දැනුවත් කරන ලදී. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි කොළඹ, බත්තරමුල්ල, කළුතර හා පානදුර ප්‍රාදේශීය ඉංජිනේරුවරු |

| | | | |
|---|---|---|---|
| 2.4 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවීම. | ණය ශේෂය අයවී ඇතත් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ණය ලේඛනවල නිරවුල් කිරීම සටහන් කර නොතිබීම නිසා සිදුවූ වරද භාණ්ඩාගාර පොත්වලින් සටහන් යොදා එය නිවැරදි කිරීමට අගෝස්තු මස තුල කටයුතු කරන බවත්, ස්ථාන මාරුවී ගොස් ඇති නිලධාරියකුගේ ණය ශේෂ තවදුරටත් අයවීමට ඇති බවත් ශේෂ වන විට එය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බවත්, ප්‍රධාන ගණකාධිකාරී හා ගණකාධිකාරී පැහැදිලි කරන ලදි.<br>ජාතික හැඳුනුම්පත් සම්බන්ධව තොරතුරු මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගත හැකි බව විගණන අධිකාරී පවසන ලදි.<br><br>අත්තිකාරම් ගිණුමේ යම් නිලධාරියෙක්, විශ්‍රාම ගිය, ස්ථාන මාරුවී ගිය, සේවය හැරගිය, මියගිය දිනයන් සටහන් කිරීම ඉදිරියට කලයුතු බව විගණන අධිකාරී පැහැදිලි කිරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී |
| 2.5 | කල් ඉකුත්වූ තැන්පතු | රත්මලාන හා හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල වසර දෙක ඉක්මවන ලද තැන්පතු පවතින බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. කල්ඉකුත්වූ තැන්පතු ශේෂ තව දුරටත් රඳවා නොගෙන ආදායමට බැර කිරීමට කටයුතු කරන ලෙස ත්, අවශ්‍ය වුවහොත් නැවත ආදායමෙන් ආපසු ගැනීමට හැකි බවත්. අභ්‍යන්තර විගණක පවසන ලදි. | ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 2.8 | මීගමුව ධීවර සමිතිය<br><br>අවිස්සාවේල්ල ඉඩම | මීගමුව ධීවර සමිතිය එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් මට්ටමින් විසදිය නොහැකි බවත්, එය අමාත්‍යාංශ මට්ටමින් විසදා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බවත්. මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් වෙත ලිඛිතව දැනුවත් කල බවත් පරිපාලන නිලධාරී පැහැදිලි කරන ලදි.<br><br>අවිස්සාවේල්ල ඉඩම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වූ බවත්, නව තක්සේරුවක් කරන තෙක් නැවත පෙර කුලීයම අයකිරීමටත්,( හිඟ කුලියද සමඟ) තීරණය වූ බව. පරිපාලන නිලධාරී පැහැදිලි කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / ගොඩනැගිලි අධ්‍යක්ෂ/ පරිපාලන නිලධාරී |

| | | | |
|---|---|---|---|
| 3.1 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම මෘදුකාංග පද්ධතියට අදාල දත්ත ස්කෑන් කර පද්ධතියට ඇතුලත් කිරිම මේවන විට සිදුකර ඇති බවත්, උපදේශන අංශය මේ වන විට මෙම මෘදුකාංශය මඟින් කටයුතු කරන බවත්, ආයතන අංශයේ දෛනික තැපැල ද දැනට මෙම මෘදුකාංගය මඟින් පවත්වාගෙන යන බවත්, මේ මස අවසන් වන විට අනෙකුත් අංශ වලද මෙම මෘදුකාංගය මඟින් කටයුතු සිදු කිරිමට කටයුතු කරන බවත් නි.ප්‍ර.ලේ .(ඉංජිනේරු) පැහැදිලි කරන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |

## 2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරිම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | වාහන පවරා ගැනිම් හා පවරා දිම් තවදුරටත් පවතින බවත් , පවරා තිබුණද පවරා දුන් හා පවරාගත් ආයතන දෙකෙහිම ගිණුම්වලට එහි වටිනාකම ඇතුලත්ව නොමැති බව |
| 2 | මුල්‍ය නොවන වත්කම් විසර්ජන ගිණුමේ පෙන්වා ඇති නුමත් එම ගිණුම්ගත කිරිමක් වි නොමැති බවත්, ලබා ගත් භාණ්ඩ මිලදිගත් වර්ෂය තුලම ඉන්වේන්ට්‍රිගත කර නොතිබිම. |
| 3 | මෘදුකාංග පද්ධති ගිණුම්ගත තිරිම සම්බන්ධ ක්‍රමවේදයක් නොමැති බවත් ලබන වසර වන විට භාණ්ඩාගාරය විසින් ගිණුම් ගත කිරිම සම්බන්ධ ක්‍රමවේදයක් සැකසිය යුතු බව. |

## (3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරිම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශිය කාර්යාල වල මාසය අවසානයට මුදල් පොතේ ශේෂය ඉහල අගයක් පවතින බව. |
| 2. | වත්තල ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයෙන් බැංකු සැසඳුම් දෘඩ පිටපත ඉදිරිපත් කර ඇති බවත්, එම වාර්තාව soft copy පමණක් එවිම ප්‍රමාණවත් බව |
| 3. | පානදුර ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයේ නිලධාරියෙකු සතියේ දින පලමු ප්‍රමාදව පැමිණ ඇති බවත්, නමුත් සති අන්ත දින වල නිමිත වේලාවට පැමිණිම හා පිටවිම සටහන්කර ඇති බවත්, එම නිලධරයා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති අතර සති අන්ත පැමිණමෙන් එම නිවාඩු හිලවු කර ඇති බව පෙන්වා දෙන අතර මේ සම්බන්ධයෙන් පසු විපරම් කරන ලෙස |

**<u>භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම ) ගේ අදහස් හා පැහැදිලි කිරීම්</u>**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට වඩා වැදගත් වන්නේ එම පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ඉදිරියටද සක්‍රියව පවත්වාගෙන යාම බව |
| 2. | පසු ගිය කාල වකවානුව තුල රටේ පැවති ඉන්ධන අර්බුදය, පොදු ප්‍රවාහන අපහසුතා හා හදිසියේ පනවන ලද ඇඳිරි නීති තත්ත්වයන් මත ටෙන්ඩර් විවෘත කිරීම් නියමිත දිනට වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වීම් ආදිය සිදු වූ බැවින් එම වලක්වා ගත නොහැකි රාජයේ ගත් තීරණ අනුව දෛනිකව රාජකාරි කටයුතු සඳහා සිදුවූ සිදුවීම් අදාල ගොනුවල සටහන් කිරීම ඉතා වැදගත් බව. |
| 3. | දැනට පවත්වංගෙන යන ව්‍යාපෘති හා අළුතින් ආරම්භ කිරීමට නියමිත ඉදිකිරීම් ව්‍යාපෘති මේ වසරේ දෙසැම්බර් මාසය අවසානයේ අවසන් කිරීමට හැකියාවක් පවතිනම් පමණක් ආරම්භ කිරීමට ප්‍රාදේශීය ඉංජිනේරු වරුන් දැනුවත් කිරීම සුදුසු බව |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට පැවැත්වීම ඉතා වැදගත් බවත් විගණනයෙන් ලබාදෙන ලද පැහැදිලි කිරීම් රාජකාරි කටයුතු වලදී යොදා ගැනීම සාර්ථකව රාජකාරි කිරීමට පහසුවක් බවත්, රැස්වීම සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් විගණන අධිකාරි, භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම ), අභ්‍යන්තර විගණක හා අනෙක්තු සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතිඑල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 13.00 ට පමණ අවසන් කරන ලදී.

ජී.ඩබ්.පී.පෙරේරා,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)වැ.බ..
පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)